# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,323 - 2023 මාර්තු මස 10 වැනි සිකුරාදා - 2023.03.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 78 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 79 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 මාර්තු මස 31 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 මාර්තු මස 17 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


77- B 082435 — 353 (2023/03)
D 1 -

# පිස්කල් විකිණීම්

## ප්‍රසිද්ධ පිස්කල් වෙන්දේසියේ විකිණීම

කැලණිය, වෙදමුල්ල, නුවර පාර, අංක 933 දරන ස්ථානයේ ප්‍රධාන කාර්යාලය පිහිටි ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

අංකය : ගම්පහ දිසා අධිකරණ
නඩු අංක : 337/උකස්
වැලිසර දිසා අධිකරණ
ඇස්කීසි අංක : 18/22
වටිනාකම : රු. 1,492,374.70
ක්‍රියාපටිපාටිය : සාමාන්‍ය

*....................පැමිණිලිකරු.*

*එදිරිව*

1. වැලිසරගේ මනෝජ් මොහාන් ප්‍රනාන්දු,
2. වර්ණකුලසූරිය තරංගා ප්‍රනාන්දු

*දෙදෙනාම* : අංක 947, තලගොල්ල පාර, රාගම.

*....................විත්තිකරුවන්.*

ගම්පහ දිසා අධිකරණයේ පැවති ඉහත කී අංක 337/උකස් නඩුවට, වර්ෂ 2018 ක් වූ ජනවාරි මස 29 වැනි දින ඇතුලත් කර ඇති සමථ තීන්දු ප්‍රකාශය ප්‍රකාරව, ගෙවිය යුතු වාරික මුදලින් 1 වන සහ 2 වන විත්තිකරුවන් විසින් පැමිණිලිකාර බැංකුව වෙත ගෙවා ඇත්තේ රුපියල් හත්ලක්ෂ පනස් එක් දහස (රු. 751,000/-) ක් පමණක් බැවින්, තීන්දු ප්‍රකාශිත මුදල වන, පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති පරිදි රු. 1,492,374.70 මුදල සහ හිඟ මුදල වන රු. 1,311,329.73 ක මුදල මත 2015.05.22 වැනි දින සිට ගෙවා නිමකරන තෙක් වාර්ෂිකව 24% බැගින් වූ පොළිය ද, ව්‍යාපාර පිරිවැටුම් බද්ද සහ වෙනත් ව්‍යවස්ථාපිත ගාස්තු ද යන සම්පූර්ණ මුදලින් ගෙවා ඇති රු. 751,000/- මුදල අඩුකර ඉතිරි මුදල ද, නඩු ගාස්තු ද, ඇස්කීසි සඳහා යන වියදම් ද අයකර ගැනීම සඳහා මෙම නඩුවේ දූනට තහනමට ගෙන ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කරන නිශ්චල දේපල සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ පළතුරු ආදී සියලු දේත්,

**වර්ෂ 2023 ක් වූ මාර්තු මස 23 දින පස්වරු 2.00** ට එකී නිශ්චල දේපල පිහිටි රාගම, තලගොල්ල පාරේ අංක 947 දරන ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වනු ලැබේ.

*දේපල පිහිටීම.-* මෙහි දක්වෙන නිශ්චල දේපල රාගම ශික්ෂණ රෝහලට දකුණු පසින් ඇති වෛද්‍ය පීඨ පාරේ මීටර් 700ක් පමණ යන විට මහජන බැංකු ATM යන්ත්‍රය ඉදිරිපිට ඇති දකුණු පසට පිහිටි පාරේ අවසානයට ඇති ඉඩම හා නිවස, පහසුවෙන් සොයා ගත හැකි ය.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින්, (i) ගැණුම් මිලෙන් 25%ක් ද, (ii) පිස්කල් ගාස්තු සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තිය ප්‍රකාරව, පිස්කල්ගේ ගාස්තු ද ගෙවිය යුතුයි. තව ද, ගැණුම් මිලෙන් ඉතිරි 75% ක් වූ මුදල විකුණුම් දින සිට දින තිහක් (30) ඇතුලත එකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතු ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාව තුළ අංක 181, රාගම ග්‍රාම නිලධාරි වසම තුළ රාගම පිහිටි නාගහලන්ද සහ තලගොල්ල නමැති ඉඩමෙන් ඩබ්ලිව්. බී. එල්. ප්‍රනාන්දු, බලයලත් මිනින්දෝරු තැනගේ අංක 2315 සහ 1996 මාර්තු මස 05 සහ 28 දිනයන් දරන සැලැස්ම ප්‍රකාර බෙදාවෙන් කරන ලද කැබලි අංක 04 දරන කොටසට මායිම් :

උතුරට : කැබලි අංක 01 සහ 05 ද,
නැගෙනහිරට : කැබලි අංක 03 සහ 05 ද,
දකුණට : එම්. සී සිල්වා සහ බී. සිල්වාගේ ඉඩම් ද,
බස්නාහිරට : සී. ඩේසිගේ ඉඩම සහ පාර ද,

යන මායිම් තුළ පිහිටි පර්චස් විසිදෙකයි දශම තුන (පර්. 22.3) ක් *හෙවත්* හෙක්ටයාර් 0.05640ක් විශාල බිම් කොටස සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගසකොළ, පළතුරු ආදී සියලුදේත් සමගින් වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 522/151 දරන පත්ඉරුවේ ලියාපදිංචිව ඇත.

*මාර්ග අයිතිය :*

තව ද, ඉහත කී ඉඩමට යාම් ඊම් සඳහා ඉහත කී ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාව තුළ අංක 181 රාගම ග්‍රාම නිලධාරි වසම තුළ රාගම පිහිටි නාගහලන්ද සහ තලගොල්ල නමැති ඉඩමින් ඩබ්ලිව්. බී. එල්. ප්‍රනාන්දු බලයලත් මිනින්දෝරු තැනගේ අංක 2315 සහ 1996 මාර්තු මස 05 සහ 28 දිනයන් දරන සැලැස්ම ප්‍රකාර බෙදාවෙන්කරන ලද කැබලි අංක 05 දරන ඉඩම් කොටස මතින් මාර්ග අයිතිය ද සමගින් වේ.

අධිකරණයේ අණ පරිදි,

රෙජිස්ට්‍රාර්තැන/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - වැලිසර.

03-134

---

## විවිධ දැන්වීම්

### ''ජගත් කුමාර සිසුනැණ පදනම'' සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ජගත් කුමාර සුමිත්‍රාආරච්චි වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 53 (1) යටතේ ජගත් කුමාර සිසුනැණ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී ජගත් කුමාර සිසුනැණ පදනම සංස්ථාගත කිරීමයි :-

01. ශ්‍රී ලාංකීය සිසු දරු දැරියන්ගේ නැණ නුවන පාදා ඔවුන් යහපත් පුරවැසියන් බවට සමාජගත කිරීම ;

02. සෑම දරුවෙක් වෙනුවෙන් ම (For Every Child) යන එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල UNICEF අරමුණ හා එකඟ වෙමින් ශ්‍රී ලාංකීය සිසු දරු දැරියන්ගේ විනය හා සංස්කෘතික සාරධර්මයන් ආරක්ෂා කිරීම හා පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලැස්වීම ;

03. ඉගෙනුම කේන්ද්‍රීය කරගත් අධ්‍යාපන කුසලතා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය සහයෝගය, අනුග්‍රහය හා ආධාර ලබා දීම;

යනාදිය වේ.

ජගත් කුමාර සුමිත්‍රාආරච්චි,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කොළඹ දිස්ත්‍රික්කය.

03 - 155

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.